හම්බන්තොට ප්‍රාදේශීය සභාව - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාලව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 04 කින් තහවුරු කරන ලද, ලැබිය යුතු මුද්දර ගාස්තු එකතුව රු.මිලියන 3.81 ක ආදායම් ගිණුම් වලින් අත්හැරී තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් තහවුරු කරන ලද මුද්දර ගාස්තු ආදායම් ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලැබිය යුතු උසාවි දඩ ආදායම් ගිණුම්ගත කර නොතිබුණු අතර 2024 වර්ෂයේ ඔක්තොබර් මාසයට අදාළව පමණක් ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.මිලියන 1.01 ක් වී තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් වර්ෂයට අදාල උසාවි දඩ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු කළමනාකරණ තොරතුරු පද්ධති 04 ක එකතු පිරිවැය වූ රු.720,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අස්පෘශ්‍ය වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයට අදාල ගෙවිය යුතු වියදම් එකතුව රු.171,683 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	වියදම් සඳහා දෙසැම්බර් 31 දිනට ණයහිමියන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේ සභාවේ මයුරපුර සතිපොලෙහි ඉදිකිරීම් වෙනුවෙන් එකතුව රු.110,210 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අඩුවෙන් ප්‍රාග්ධනිත කරන ලද ජංගම නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳු ගිණුම් ශේෂ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 02 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.මිලියන 8.63 ක වෙනසක් නිරීක්ෂණය විය.	ස්ථාවර වත්කම් වටිනාකම නිවැරදි කරන ලද බව හා නිවැරදි පිටපත් අමුණා එවන බව.	අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
උපලේඛන, උපයෝගීලේඛන, සමීක්ෂණ වාර්තා සහ ශේෂ සනාථන නොමැතිවීමෙන් එකතුව රු.මිලියන 21.24 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.	සමීක්ෂණයක් හරහා තක්සේරුවක් සිදුකර කර 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව හා ගණනය කළ ආකාරය ඉදිරිපත් කර ඇති බව.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1946 අංක 30 දරන බදු හා තක්සේරුකරණ ආඥා පනතේ 20 වගන්තිය	වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර 2010 හා 2011 වර්ෂවලදී සිදුකරන ලද තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂය තුළ වරිපනම් බදු අයකිරීම නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය වර්ෂ 13 ක් විය.	තක්සේරු කටයුතු සිදු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව සමග ගිවිසුම්ගත වී ඇති බව.	වරිපනම් දේපල යොමුගත පනතේ වගන්ති ප්‍රකාරව කාලානුරූපව තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371	අත්තිකාරම් අදාළ කාර්යය අවසන් වූ විගසම පියවිය යුතු වුවත්, 2010,2011 හා 2012 වර්ෂයන්ට අදාළව ලබා දී තිබුණු වටිනාකම රු.63,250 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.	2012 හා 2013 වර්ෂ සඳහා පිළිවෙලින් රු.55,000 ක් හා රු.8,250 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව ලබාගත් අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය තුළ සභාව සතු වටිනාකම රු.මිලියන 3.67 ක් වූ ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින ජල බවුසරයක් සහ ට්‍රැක්ටර් රථයක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	අපහරණය සම්බන්ධව පත්කර ඇති විශේෂ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත කටයුතු කරන බව.	ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින වාහන සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 9.50 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 5.38 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	715,085	787,472	952,239	713,017	683,606	764,606	819,264	877,784
කුලී	19,626,035	19,660,482	19,533,374	236,468	24,016,200	24,072,754	23,975,892	109,360
බලපත්‍ර ගාස්තු	23,272,233	3,343,007	3,005,047	402,960	12,143,291	2,053,703	2,230,903	65,000
වෙනත් ආදායම්	18,836,778	22,723,568	11,752,244	11,805,768	10,527,970	10,323,856	10,995,178	834,444
එකතුව	**62,450,131**	**46,514,529**	**35,242,904**	**13,158,213**	**47,371,067**	**37,214,919**	**38,021,237**	**1,886,588**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.මිලියන 1.89 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.මිලියන 46.51 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.මිලියන 48.40 ක් වුවද, රැස්කරන ලද ආදායම රු.මිලියන 35.24 ක් වූයෙන් ආදායම රැස්කිරීමේ ප්‍රගතිය සියයට 73 ක මට්ටමක විය.	2025 මාර්තු 31 දිනට හිඟයෙන් රු.මිලියන12.30 ක් අයකර ගෙන ඇති බව.	හිඟ ආදායම් රැස්කර ගැනීමේ ප්‍රගතිය වර්ධනය කරගත යුතුය.

2.2.3 වරිපනම් හා බදු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් ආදායම රු.701,017 ක් වූ අතර ඉන් වරිපනම් ඒකක 315 ක රු.471,032 ක් වසර 03 කට වඩා වැඩි කාලයක සිට හිඟ ශේෂයක් විය. එය අයවිය යුතු ආදායමෙන් සියයට 67 ක ප්‍රමාණයක් වූ අතර එහි රු.5000ට වැඩි ඒකක 08 කින් රු.223,369 ක හිඟ ශේෂයක් ඇතුලත් වී තිබුණි. මෙම හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියෙහි සඳහන් විධිවිධාන පරිදි අයකරගෙන නොතිබුණි.	හිඟ ශේෂ අයකර ගැනීමට සැලැස්මකට අනුව ඉදිරියේදී කටයුතු කරන බව.	පනතේ (1)158වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ආ)	සභා බල ප්‍රදේශය තුළ පිහිටි රාජ්‍ය ආයතන 04 ක් නිසි පරිදි වරිපනම් බදු සභාව වෙත ගෙවා නොතිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට හිඟ මුදල රු.170,097 ක් විය.	අදාළ ආයතන වෙත ලියාපදිංචි තැපැල හරහා ලිපි මගින් දැනුම් දී ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඇ)	අම්බලන්තොට සභා බල ප්‍රදේශයට අයත් බැරගම පාර දකුණ, වරිපනම් ඒකක 46 ක් හම්බන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2018 වසරේ සිට බිල්කර රු.105,768 ක හිඟයක් පැවතියද, එම ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ මුදල කපා හැරීම සඳහා අනුමැතියට යොමු කර ඇති නමුත් පිළිතුරු ලැබී නොමැති බව .	හිඟ ආදායම් කඩිනමින් නිරවුල් කරගත යුතුය.
(ඇ)	2019 වර්ෂයේ ඉදිකිරීමට අවසර ලබාදී තිබුණු සම්ප්‍රේෂණ කුළුණු 03 කින් 2020 වර්ෂයේ සිට වසරකට රු.3,000 බැගින් රු.60,000 ක් ව්‍යාපාර බදු ආදායම් සභාවට ලැබී නොතිබුණි.	අනුකූලතා සහතික නිකුත් කිරීමෙන් අනතුරුව ව්‍යාපාර බදු අය කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.

2.2.4 දැන්වීම් පුවරු ගාස්තු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභා බල ප්‍රදේශය තුළ සවිකර ඇති දැන්වීම් පුවරු සමීක්ෂණය අනුව සභාවට අයවිය යුතු රු.402,960 ක දැන්වීම් පුවරු ගාස්තු අයකර ගෙන නොතිබුණු අතර 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(xxx) වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.	හිඟයෙන් රු.303,600 ක් අයකර ගෙන ඇති අතර රු.99,360 සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	පනතේ 126(xxx) වගන්තිය අනුව හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.

(ආ)	නියැදි ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී සහා බල ප්‍රදේශයේ සවිකර ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 10 ක් සමීක්ෂණයට ඇතුළත් වී නොතිබූ අතර ඒ වෙනුවෙන් රු.203,960 ක ගාස්තු සභාවට අයකර ගතයුතු විය.	2025 වසරේ ගාස්තු හිඟ ආදායම් කඩිනමින් අයකිරිමට කටයුතු කරන බව.	අයකරගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2023 අගෝස්තු 11 දිනැති අංක HPS/BA/2023/06 දරන වාණිජ ගොඩනැගිලි සැලසුම් අයදුම්පත වර්ෂ 01 මාස 05 ක කාලයක් ගතවී තිබුණද, අනුමත කර නොතිබුණි. නමුත්, 2025 පෙබරවාරි 05 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම ගොඩනැගිල්ල ස්ලැබ් මට්ටම දක්වා ඉදිකර ව්‍යාපාර කටයුතු සිදුකරමින් පැවතුණි. ඒ අනුව 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය II වන කොටසේ 02 උපලේඛනය ප්‍රකාරව නිසි සංවර්ධන බලපත්‍රයක් රහිතව සහා අවසරයකින් තොරව සිදුකළ ඉදිකිරීම් වෙනුවෙන් රු.42,900 ක් අයකරගත යුතු වුවද, එසේ කර නොතිබුණි.	නිර්වන්දි ගිවිසුමට එළඹිය යුතු බවට මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දී ඇති නමුත් ගිවිසුම ලබා නොදීම මත අනුමත කර නොමැති හෙයින් අනුමත කළ පසු රු.42,900 ක් වූ ආවරණ ගාස්තු අයකර ගන්නා බව.	සභාව වෙත අයවිය යුතු නියමිත ගාස්තු අයකර සංශෝධිත සැලසුම් අනුමත කළ යුතුය.
(ආ)	2024 මාර්තු 28 දින අනුමත කර තිබුණු වර්ගමීටර් 385.50 කින් යුත් අංක HPS/BA/2024/03/RN දරන වාණිජ ගොඩනැගිලි සැලැස්මට අදාළව ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ ප්‍රමාණය වර්ගමීටර් 440.14 ක් විය.ඒ අනුව ප්‍රමාණය ඉක්මවා ඉදිකළ වර්ගමීටර් 54.64 ක් සඳහා රු.109,280 ක ආවරණ අනුමැතිය ලබා ගැනීමේ ගාස්තු සභාව විසින් අයකරගෙන නොතිබුණි.	අනවසරයෙන් ඉදි කර ඇති ඉදිකිරීම සඳහා සංශෝධිත සැලැස්මක් ඉදිරිපත් කර අනුමත කර ගන්නා ලෙස ලිපි මගින් දැනුම් දී ඇති බව.	සභාව වෙත අයවිය යුතු නියමිත ගාස්තු අයකර සංශෝධිත සැලසුම් අනුමත කළ යුතුය.
(ඇ)	2000 අංක 53 හා 1988 අංක 56 දරණ පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පරිසර පනත යටතේ ප්‍රකාශිත 2264/18 හා 2022 ජනවාරි 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව 2015 වර්ෂයේ පමණ සිට ආරම්භ කර පවත්වාගෙන ගිය ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ඇති මළ අපසන්දන පොදු පිරිපහදු පද්ධතිය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.	මළ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් ප්‍රතිපත්තිමය වශයෙන් තීරණය කර ක්‍රියාත්මක කිරීමට ඉල්ලීම් කර ඇති බව.	යොමුගත නීතිරීති ප්‍රකාරව පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජන දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ආයතන අතර සම්බන්ධීකරණයකින් සහ නිසි අධ්‍යනයකින් තොරව ව්‍යාපෘති යෝජනා සකස් කර ක්‍රියාත්මක කිරීම හේතුවෙන් හම්බන්තොට ප්‍රාදේශීය සභාව විසින් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු. මිලියන 7.96 ක වියදමක් දරා 2021 දෙසැම්බර් 07 දින වැඩ අවසන් කර තිබුණු වියළි කලාපීය උද්භිද උද්‍යානය අසළ වාහන නැවතුම්පොළ එම දිනයේ සිට වසර 03 කට අධික කාලයක් සැලකිය යුතු ආදායමක් උපයා නොගෙන ඌණ උපයෝජිතව තිබුණි.	උද්භිත උද්‍යානය වෙත පැමිණෙන සංචාරකයින් උද්‍යානය අභ්‍යන්තරයේ රථගාල භාවිතා කරන බැවින් ආදායම අහිමි වී ඇති බව.	ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ආයතන අතර සම්බන්ධීකරණය කරගෙන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් සභාව වෙත භාර දී තිබූ රු.මිලියන 06 ක වටිනාකමින් යුතු ජල බවුසරයක අයිතිය වාහන ලබාදී වසර දෙකකට වැඩි කාලයක් ගතවී ඇතත් නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ජල බවුසරය පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	සභාව සතු ජල බවුසර් 02 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 53 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සභාව සතු ඉඩම් 06 ක් හා ගොඩනැගිලි 05 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් කිසිඳු ඵලදායි කටයුත්තකට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි.	සියලු ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ඌන උපයෝගී වත්කම් ඉදිරියේදී ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව.	සභාව සතු ඉඩම් 53 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගතයුතු අතර ඌන උපයෝජිත ඉඩම් 06 ක් සහ ගොඩනැගිලි 05 ක් ඵලදායී කටයුත්තක යෙදවිය යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)(i)	මයුරපුර සතිපොළ වාහන නැවතුම්පොළ ඉදිකිරීම සඳහා 2021 සැප්තැම්බර් 09 දින සිට 2021 දෙසැම්බර් 07 දින දක්වා කාලය තුළ නිම කිරීමට රු.මිලියන 7.90 ක ඇස්තමේන්තු වටිනාකමකට ගිවිසුම්ගතව පවරා තිබුණි. ඉන් වැඩ විෂයන් 08 ක් ඉටුකර නොතිබියදී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 237 (අ)(i) රෙගුලාසියට අනුකූල නොවී, නිමකළ වැඩ කොටස් සඳහා 2023 දෙසැම්බර් 29 දින රු.මිලියන 1.72 ක් ද 2024 මැයි 07 දින සියයට 10 රඳවුම් රු.278,600 ක් ද ලෙස එකතුව රු.මිලියන 2 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කොන්ත්‍රාත්තුව අතරමග අතහැර දැමීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	කොවිඩ් 19 වසංගතය සමඟ ඇතිවූ තත්ත්වය සහ රට තුළ ඇතිවූ ආර්ථික ගැටළු හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ අතරමග නතර කළ බව.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කටයුතු කළ යුතුය.
(ii)	ඉහත පරිදි ඉටු නොකළ වැඩ විෂයයන්වල ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 4.75 ක් වී තිබුණු අතර 2024 වර්ෂයේ රු.154,110 ක් වැයකර නැවත පුවත්පත් දැන්වීම් පලකර ඉටු නොකල වැඩ කොටස් සඳහා රු.මිලියන 7.60 ක (වැට් සහිත) කොන්ත්‍රාත් වටිනාකමට කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්ගතව ඉටුකරවා ගෙන රු.මිලියන 8.26 ක ගෙවීම් කර තිබුණි. පැරණි කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අත්හැර දැමීම හේතුවෙන් සියයට 74 ක ප්‍රමාණයක අතිරේක පිරිවැයක් සභාවට දැරීමට සිදුවී තිබුණි.	තාක්ෂණ සේවා නිලධාරී පූර්ණ අධීක්ෂණය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබීම හා තත්ව පරීක්ෂණ වාර්තා ලබා ගෙන ඇති නිසා ගෙවීම නිර්දේශ කළ බව.	රජයට පාඩු සිදුනොවන ආකාරයට අරමුදල් අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ තනතුරු 06 කට අදාළ අතිරික්තතා 17 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇති බව.	සභාවේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනයක් සිදුකළ යුතුය.

(ආ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව එකම සේවා ස්ථානයේ වසර 05 ක සේවා කාලය ඉක්මවන සෑම නිලධාරියෙකුටම ස්ථාන මාරු ලබාදිය යුතු වුවත්, සභාව තුළ සේවය කරනු ලබන නිලධාරීන් හතරදෙනෙකු වසර 09 සිට වසර13 දක්වා වූ කාල පරිච්ඡේදයක් එකම ස්ථානයේ සේවය කරමින් රැඳී සිටින බව දක්නට ලැබුණි.	වාර්ෂික ස්ථාන මාරු අයදුම් අවලංගු වීම හේතුවී ඇති බව.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව වසර 05 ඉක්මවා ඇති නිලධාරීන් වෙනත් සේවා ස්ථානවලට මාරුකළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තත්‍ය ගමන් වියදම් පිළිවෙලින් රු.මිලියන 2.46 ක් හා රු. මිලියන 2.97 ක් වූයෙන් රු.513,023 ක අහිතකර විචලනයක් නිරීක්ෂණය වූ අතර, එහි ප්‍රතිශතය අයවැයගත වියදමින් සියයට 20 ක් විය.	පොදු පරිපාලනය , භෞතික , සේවාසෞඛ්‍ය වෙනත් පොදු ,සැලසුම් උපයෝගීතා සේවා වල ගමන් වියදම් වැඩි වීම හේතු වූ බව.	විචලනයන් අවම කරගත යුතු අතර ඒ සඳහා සැලසුම්කරණය විධිමත් විය යුතුය.
(ආ)	ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.මිලියන 33.45 ක් වූ අතර එම විචලනය සියයට 15 සිට සියයට 85 ක් දක්වා වූ පරාසයක පැවතුණි.	වැටුප් ප්‍රතිපූර්ණය කිරීම් සහ ප්‍රාග්ධන අධාර , බලපත්‍ර ගාස්තු ආදායම් අඩුවීම හේතුවූ බව .	විචලනයන් අවම කිරීමත්, සැලසුම්කරණය විධිමත් කර ගැනීමත්, ආදායම් රැස්කිරීම කාර්යක්ෂම කර ගැනීමත් සිදු කළ යුතුය.